# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක: **17/2016**

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2016 දෙසැම්බර් මස 5වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ සහ උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වැටුප් සංශෝධනය කිරීම - 2016**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 (1) මත පදනම්ව විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලවල වැටුප් විෂමතා නිවැරදි කිරීම සම්බන්ධයෙන් වන 2013.03.07 දිනැති අංක 03/2013, 2013.06.12 දිනැති අංක 03/2013 (i) සහ 2013.06.27 දිනැති අංක 03/2013 (ii) යන කොමිෂන් සභා චක්‍රලේඛ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් 2016.08.23 දිනැති අංක HE/EST/02/UTUJC දරන ලිපිය මගින් යොමු කරන ලද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ සහ උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වැටුප් සංශෝධනය කිරීම -2016 සම්බන්ධයෙන් වන 2016.08.18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2016 සැලකිල්ලට ගත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2016.09.22 දින පැවති සිය 949වන සභා වාරයේ දී 2016.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සංශෝධිත වැටුප් ව්‍යුහය ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී. උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් එවන ලද ලිපිය සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2016 අනුපිළිවෙලින් ඇමුණුම I සහ II හි අමුණා ඇත.

03. නව වැටුප් ව්‍යුහය තුළ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලවලට ගෙවනු ලබන පහත සඳහන් දීමනා අන්තර්ගත කර ඇත;

i) අනුපිළිවෙලින් 2011.01.17 දිනැති අංක 943, 2012.01.04 දිනැති අංක 973 සහ 2013.01.04 දිනැතිඅංක 999 යන කොමිෂන් සභා චක්‍රලේඛ මගින් ක්‍රියත්මක කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 43, අංක 46 සහ අංක 48 අනුව ගෙවනු ලබන විශේෂ දීමනාව

ii) 2014.11.13 දිනැති අංක 12/2014 හා 2015.02.12 දිනැති අංක 03/2015 දරන කොමිෂන් සභා චක්‍රලේඛ මගින් ක්‍රියාත්මක කරන ලද අංක 24/2014, අංක 24/2014 (i) හා අංක 05/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ගෙවනු ලබන රු.10,000/- ක අතුරු දීමනාව

04. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ **උපලේඛන I** හි සඳහන් සංශෝධිත වැටුප් පරිමාණයන් 2016.01.01 දින සිට අදියර 05කින් **උපලේඛන II** හි සඳහන් පරිදි ක්‍රියාත්මක කළ යුතුය.

05. උපලේඛන I හි සඳහන් ප්‍රධාන වැටුප් පරිමාණ යටතේ ඇති එක් එක් තනතුරෙහි වැටුප් කේතය අනුව සකස් කරන ලද වැටුප් පරිමාණ ඇමුණුම III හි දක්වා ඇත. 2012.06.26 සහ 2006.08.11 දිනට සේවයේ නිරතව සිටි දැනට තනතුරු දරන්නන් සඳහා වෙන් කර ඇති වැටුප් පරිමාණ සංශෝධිත වැටුප් පරිමාණ තුළ අන්තර්ගත වන බැවින් දැනට තනතුරු දරන්නන්ගේ සංශෝධිත වැටුප් පරිමාණ විශේෂයෙන් සඳහන් කර නොමැත. කෙසේ වුවද, සලකනු ලබන තනතුරෙහි සාමාන්‍ය වැටුප් පරිමාණයෙන් සුවිශේෂව වෙනස් වැටුප් පරිමාණයක් දරන [උදා. U-MN 3(II) සහ U-MN 3(I)] සේවකයකුගේ සංශෝධිත වැටුප් පරිමාණය ලබා

ගැනීමට අවශ්‍ය වන්නේ නම් අදාළ වැටුප් පරිවර්තන වගුව /වගු සුදුසු පරිදි අනුගමනය කොට සංශෝධිත වත්මන් වැටුප් පරිමාණය ගණනය කිරීමට කටයුතු කළ හැකිය.

06. කෙසේ නමුත්, කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 10 ජේදයේ සඳහන් කර ඇති පරිදි පත්වීම් / උසස්වීම් ලබා දීමේ ලිපි නිකුත් කරන සෑම අවස්ථාවකදී ම එහි ඇමුණුම III හි සඳහන් කර ඇති 2020 සඳහා අදාළ වැටුප් පරිමාණය සඳහන් කළ යුතු අතර ඒ සමඟම, වැටුප් ගෙවීම් සිදු කරනුයේ කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන II අනුව බව සඳහන් කළ යුතුය.

07. 2016.01.01 දින සිට 2016.11.30 දක්වා කාලය අතරතුර ගෙවන ලද විශේෂ දීමනාව සහ අන්තර් දීමනාව මත විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල සහ විශ්‍රාම වැටුප් අරමුදල සඳහා දායක මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් වන උපදෙස් යථා කාලයේ දී දැනුම් දෙනු ඇත.

08. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2016 හි ඇතැම් කරුණු පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් පැහැදිලි කිරීම් විමසා ඇති බැවින් එම දෙපාර්තමේන්තුවෙන් පිළිතුරු ලැබෙන තෙක් මෙම චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව කටයුතු කරන මෙන් උසස් අධ්‍යාපන ආයතන වෙත නියම කෙරේ.

09. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා

සභාපති

පිටපත්:

1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරිවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරිවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

ලිපි ගොනු අංකය : යූජීසී/එච්ආර්/2/9/86(16වන වෙළුම)

ටී/-